# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2312/26 - 2022 දෙසැම්බර් මස 28 වැනි බදාදා - 2022.12.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 6/1996.

**1996 අංක 10 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනත**

නිවේදනය

**(පළමු වන උපලේඛනයේ (1) වන ඡේදය)**

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ වන මම මෙම නිවේදනය මගින්, 1996 අංක 10 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනතේ පළමුවන උපලේඛනයේ (1) වන ඡේදයේ කාර්යය සඳහා මුදල වශයෙන් 2023.02.01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි රුපියල් මිලියන විස්සක මුදල වෙනුවට රුපියල් මිලියන පනහක මුදල නියම කරමි.

මෙම මූල්‍යමය අගය ඉහළ දැමීම 2023.01.31 වැනි දිනට පෙර මහාධිකරණයේ පවරා ඇති නඩු කටයුතු සඳහා බල නොපැවැත්විය යුතු ය.

1996 අංක 10 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනතේ පළමුවන උපලේඛනයේ (1) වන ඡේදය යටතේ කරන ලදුව, 2019 පෙබරවාරි මස 28 වැනි දින අංක 2112/33 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය, ඒ යටතේ යථා පරිදි කරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

ආචාර්ය විජයදාස රාජපක්ෂ,
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2022 දෙසැම්බර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

EOG 12 - 0376


1A - G 38467 — 56 (2022/12)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*